# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 3 ශ්‍රේණිය - පරිසරය (දෙසැම්බර්- 2 සතිය)

## 15 තේමාව - මිනිසා හා තොරතුරු

- දුවේ පුතේ සෙ. මී 20 පමණ දිග පළල ඇති බ්‍රිස්ටල් බෝඩ් කෑල්ලක් සොයාගන්න.
- ගම් ටිකකුත් සොයා ගන්න.
- වියළාගත් මල්, කොළ, පාට පොල්කුඩු වැනි ඕනෑම දෙයක් භාවිත කර සුබපැතුම් පතක් නිර්මාණය කරන්න.
- එහි සුබ ප්‍රාර්ථනාව ලියන්න.

  දීර්ඝායුෂ ලැබේවා !

  නීරෝගී බව ලැබේවා !

  සහ උපන්දියක් වේවා !

- සුබ පැතුම් පත දැමිය හැකි තරමට කවරයක් A4 කඩදාසියක ආධාරයෙන් සකස් කරගන්න.
- මෙය ඔබ කැමැතිම කෙනාට ලිපිනය ලියා තැපල් කරන්න

- දුවේ පුතේ බ්‍රිස්ටල් බෝඩ් එකක් හෝ ඒ තරමට වෙනත් කඩදාසියක් එහෙමත් නැත්නම් තනිපාට රෙදි කෑල්ලක් වුණත් කමක් නැහැ.
- එය අරගෙන ඔබේ කාමරයේ හෝ වෙනත් සිදුසු තැනක අලවාගන්න.
  (ඔබේ උස ප්‍රමණයෙන්)
- "පුංචි ඔබේ බිත්ති පුවත්පත නිර්මාණය" දැන් මේ සතිය තුල ඔබේ නිවසේ සිදුවන විශේෂ දේවල් කඩදාසිවල ලියලා අලවන්න.
- ඔබේ නිවසේ සිදුවන ආගමික කටයුතු, ඔබේ නිවසේ අයකරන ක්‍රීඩා කටයුතු, විහිළු සිනා යන දේවල් වුණත් කමක් නැහැ.

  උදා :- අද තාත්තා වත්තේ කෙසෙල් කැනක් රු 1500/- කට විකුණුවා. අම්මා උදේට කිරිබත් හැදුවා.

  අපි හැමෝම එකතුවෙලා රාත්‍රියේ ගුවන් විදුලියෙන් බණ ඇහුවා වාගේ.